# ෆෙඩරල් වැඩසටහන්

අභ්‍යන්තර ආදායම් සේවා

තානාපති කාර්යාලයේ අභ්‍යන්තර ආදායම් සේවා (IRS) කාර්යාලයක් නැත.

කලින් විදේශවල අභ්‍යන්තර ආදායම් සේවා කාර්යාලවලින් සපයන ලද  බදු ගෙවන්නන්ගේ සේවය ද තවදුරටත් ලබා ගත නොහැක. පිටරටවල ජීවත් වන හා වැඩ කරන ඇමරිකානු පුරවැසියන් සහ අනිකුත් බදු ගෙවන්නන් මුහුණ දෙන සමහර සංකීර්ණ ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය පෝරම ලබා දීමත්, ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමත් සඳහා අන්තර්ජාතික බදු ගෙවන්නන්ගේ වෙබ් අඩවියක් නිර්මාණය කර තිබේ. මෙහි ඇති අනිකුත්  තොරතුරු අතර විදේශවල ඉපයූ ආදායම් පිළිබඳ විස්තර හා විදේශ නිවාස වැය බැහැර කිරීම හා විදේශ බදු බැර මෙන් ම බදු වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ද වේ. මෙම වෙබ් අඩවියේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA) හා විදේශීය බැංකු හා මූල්‍ය ගිණුම වාර්තාව (FBARS) පිළිබඳ තොරතුරු ද  අඩංගු වේ.

http://www.irs.gov/individuals/international-Taxpayers

ඔබ පුද්ගලික හෝ ව්‍යාපාරික ගිණුම් පිළිබඳ ප්‍රශ්න ඇති, එක්සත් ජනපදයෙන් පිටත ජීවත් වන බදු ගෙවන්නෙක් නම් කරුණාකර අන්තර්ජාතික බදු ගෙවන්නන්ගේ සේවයේ  ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.

අන්තර්ජාතික ඇමතුම් මධ්‍යස්ථානය සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව.6.00 සිට ප.ව.11.00 දක්වා ක්‍රියාත්මකයි. (නැගෙනහිර වේලාව)

දුරකථනය: (267) 941-1000 (ගාස්තුවලින් තොර නොවේ)

ෆැක්ස්: (267) 941-1055

අන්තර්ජාතික බදු ගෙවන්නන්ගේ සහයෝගිතා  සහාය ලබා ගැනීමට 1-877-777-4778 නම් ගාස්තු රහිත බදු ගෙවන්නන්ගේ සහයෝගිතා සේවා අංකය අමතන්න.